# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2505/51 - 2026 සැප්තැම්බර් මස 08 වැනි අඟහරුවාදා - 2026.09.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේද*, 1951 අගෝස්තු 17 දාතම අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු 25 දාතම අංක 14778 *ගැසට් පත්‍රයේ* ද, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව, 2009.10.02 වන දින අංක 1622 දරන *ගැසට් පත්‍රයේද* පළ වූ බදුල්ල කතරගම දේවාලයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථාව අනුවද බදුල්ල ප්‍රාදේශීය ලේකම් වන ඉන්දික ගයාන් පතිරණ වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2026 වර්ෂයේ බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

1. 2026 සැප්තැම්බර් මස 16 වැනි දින අළුයම කප් සිටුවීමෙන් බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර ආරම්භ වී, 2026 සැප්තැම්බර් මස 12 වන දින සිට සැප්තැම්බර් මස 17 දින දක්වා (දින 06) අභ්‍යන්තර පෙරහැර ද, 2026 සැප්තැම්බර් මස 18 දින සිට සැප්තැම්බර් මස 22 දින දක්වා (දින 05) කුඹල් පෙරහැර ද, පැවැත්වීමට නියමිත අතර 2026 සැප්තැම්බර් මස 23 දින සිට සැප්තැම්බර් මස 27 දින දක්වා (දින 05) රන්දෝලි පෙරහැර ද පැවැත්වීමට නියමිතය 2026 සැප්තැම්බර් මස 28 වන දින අළුයම දිය කැපීමේ මංගල්‍යය, 2026 සැප්තැම්බර් මස 28 දින දහවල් පෙරහැර ගෙවදීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

   පෙරහැරේ ගමන් මාර්ගය :-

2. සැප්තැම්බර් මස 27 දින පමණක් බදුල්ල කතරගම දේවාලයේ සිට පහල වීදිය ඔස්සේ මුතියංගණ රාජ මහා විහාරයටද, ඉන් පසු මුතියංගණ රාජ මහා විහාරයේ පෙරහැර පෙරටු කොට ගෙන ලොන්ඩන් පාර, අනගාරික ධර්මපාල මාවත, කොකෝවත්ත පාර, උදයරාජ මාවත, වැල් බෝධිය හන්දිය, රජ වීදිය, බසාර් වීදිය, පහළ වීදිය ඔස්සේ නැවත සිංහාසනය වෙත පැමිණීමට නියමිතය.

3. බදුල්ල කතරගම දේවාල භූමිය හා දේවාලයට අයත් සිංහාසනය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම හා වෙළඳාම් කිරීම තහනම් කරමි.

4. පෙරහැර කාලය තුළදී ප්‍රධාන මාර්ගවල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථ වාහන මගෙන් හෝ දේවාල භාර නිළමේතුමාගෙන් බලපත්‍රයක් නොමැතිව දේවාල භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

1A - G 47821 — 04 (2026/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

5. පෙරහැර ගමන් ගන්නා මාර්ගයන්හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදි කරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළඳුන් විසින් දේවාල පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා දේවාල භූමිය තුළ පොලිතින් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

6. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

7. කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව මගින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

8. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

9. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිළධාරියකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් අංක 03 හි දැක්වෙන කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

**ඉන්දික ගයාන් පතිරණ,**
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2026 සැප්තැම්බර් මස 07 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 -0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.